# ටෝනි අහිංසක පෙම්වතාගේ සිට



## ටෝනි රණසිංහ

කොළඹ මෝදර ප්‍රදේශයේ පදිංචිව සිටි විදුලි සංදේශ දෙපාර්ථමේන්තුවේ සේවකයකු වූ එමානුවෙල් සිරිල් සහ දෝන ලුවිසා කැතරින් යුවළගේ දෙවැනි දරුවා ලෙස ටෝනි රණසිංහ උපත ලැබුවේ 1937 ජූලි 31 දිනය. ටෝනිගේ මුල් නම රණසිංහ හෙට්ටිආරච්චිගේ ඉග්නේෂස් ඈන්තනී සිල්වා විය. එවක ඇතිවෙමින් තිබූ සිංහල ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් ලෙස මුලින්ම 'සිල්වා' හැලී ඒ වෙනුවට 'රණසිංහ' ආදේශ කෙරුණු අතර 'ටෝනි' යන්න නමට එකතුවන්නේ වේදිකා නාට්‍ය රංගන ශිල්පියෙකුව සිටියදීය.

මෝදර ශාන්ත ජෝන් විදුහලෙන් මූලික අධ්‍යාපනය ලද ටෝනි පසුව වත්තල ශාන්ත ආනා විද්‍යාලයටද, අනතුරුව මෝදර ලා සාල් විද්‍යාලයටද ඇතුළත්ව පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කළේය.

පසුව විදුලි දෙපාර්ථමේන්තුවේ ලඝු ලේඛකයකු ලෙස රැකියාවක් ලද ටෝනි කලා ක්ෂේත්‍රයට පිවිසෙන්නේ වේදිකා නාට්‍යයෙනි.

සිය ප්‍රථම වේදිකා නාට්‍ය රංගනය සිදුවූ 'රන් තෝඩු' නාට්‍යයේ හොඳම නලුවා ලෙස අග්‍රාණ්ඩුකාරවරයාගේ සම්මානයට පාත්‍රවීමට ටෝණි සිය සිනමා ජීවිතය අරඹන්නේ වේදිකාවෙනි. ඒ 1963 වර්ෂයේ වේදිකාගත කෙරුණු 'රන් තෝඩු' නාට්‍යයේ භූමිකා-වක් නිරූපනය කරමිනි. වේදිකාවට ආධුනිකයකු වුවද ඔහුගේ ඒ රංගනය වෙනුවෙන් ආණ්ඩුකාරවරයාගේ සම්මාන ප්‍රදානයේදී හොඳම නලුවාට හිමි සම්මානය ටෝනිට හිමි වීම විශේෂත්වයකි.
ටෝනි සිනමාවට පිවිසෙන්නේ ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ 'ගම්පෙරළිය' චිත්‍රපටියෙනි. පසුව ලෙස්ටර්ගේ 'රන් සළු' සහ 'දෙලොවක් අතර' චිත්‍රපට ද්වය සඳහා ද ටෝණි තෝරාගැණුනි. වේදිකාවෙන් බිහිවුණද නළුවෙකු ලෙස ටෝනි සිය මුද්‍රව සටහන් තැබුවේ සිනමාවේය. 'හන්තානේ කතාව' (1969), 'උතුමාණෙනි' (1980), 'දුහුළු මලක්'(1976), 'පරසතුමල්'(1966), 'දෙලොවක් අතර'(1966), 'සාගරයක් මැද'(1981), 'කොටි වලිගය'(1986) ඔහු රංගන දායකත්වය සැපයූ චිත්‍රපටි කීපයකි. ඔහුගේ රංගන දිවිය තුළ විවිධ චරිත රගපා ඇති චිත්‍රපට සංඛ්‍යාව 113ක් වන අතර වේදිකා නාට්‍ය සංඛ්‍යාව 12 කි. 'හිමි අහිමි', 'ආවර්ජණා', 'සුදු පරෙවියෝ', 'මහමෙර පාමුල' ඇතුළු ටෙලි නාට්‍ය 25ක පමණ රගපා ඇති ටෝනි රගපෑම වෙනුවෙන් හිමිකරගෙන ඇති සම්මාන සංඛ්‍යාවද විශාලය. ඒ අතරින් 1963 වේදිකාගත කෙරුණු 'රන් තේඩු', 1969 තිරගත වූ 'හන්තානේ කතාව' මෙන්ම 'දුහුළු මලක්'(1976) සහ 'අහසින් පොළොවට'(1978) ටෝනි හොඳම නළුවා ලෙස සම්මානයට පාත්‍ර වූ නිර්මාණයන්ය. රංගන කාර්යයට සීමා නොවුණු ටෝනි අවස්ථාව ලැබෙන පරිදි ක්ෂේත්‍රයේ වෙනත් මානයන්ට අත පෙවීය. ඔහු නාට්‍ය තුනක් නිෂ්පාදනය කළ අතර නවකතා හතරක් ලියනු ලැබුවේය. ලේඛනයේදී ඔහු වඩාත් පෙරටුගාමී වූයේ නාට්‍ය සහ චිත්‍රපට තිර රචකයකු ලෙසිනි. ප්‍රසන්න විතානගේ ගේ 'පවුරු වළලු', ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ 'අවරගිර', සුමිත්‍රා පීරිස්ගේ 'දුවට මවක මිස', ශ්‍රියාණි අමරසේනගේ 'තරණය', ඩී.බී. නිහාල්සිංහගේ 'කෙළිමඩළ' ඔහු විසින් තිර රචනා ලියන ලද සිනමා නිර්මාණ කීපයකි.

දෙලොවක් අතර 1966
චිත්‍රපටියේ නිශ්ශංකගේ චරිතය ටෝනි රගපෑවේය. ජීවරාණි කුරුකුලසූරිය එහි ශිරාණි ලෙස රගපෑවේය. ..........

**කාලයක් වේදිකාවෙනුත්, ඉන් පස්සේ දීර්ඝ කාලයක් සිනමාවෙනුත්, පස්සේ කාලෙදි යම් තරමකින් රූපවාහිනියෙනුත් අපිට දකින්නට ලැබුණු ඔබගේ රංගනයන් දැන් දැකගන්න ලැබෙන්නේ නැති තරම්. ඇයි ඒ ?**

දැන් රූපගත කිරීම්, හඬකැවීම් වගේ දේවල්වලට සහභාගිවෙන්නේ නෑ. මේ ටිකේ සැත්කමකින් පසුව ඉන්න නිසා එන වැඩ බාරගන්නේත් නැහැ. දැන් කෙමෙන් වයසටත් යනවනේ. මට දැන් හැත්තෑපහට ආසන්න වෙලා තියෙන්නේ. ඉතිං මම හිතුවා දැන් වැඩ කළා ඇති කියලා. මට ශාරීරික එක එක අමාරුකම් තියනවා. කොන්දේ අමාරුවකුත් එනවා. ඒවත් එක්ක ඉස්සර වගේ රගපෑමට කායික වෙහෙසක් දරන්න අපහසුයි.

**ඔබගේ අනන්‍යතාව සටහන්වෙලා තියෙන්නේ නළුවෙක් විදිහට. වෘත්තීය ජීවිතයෙන් ඔය විදිහට අයින්වෙලා ඉදිරියේදී මොනවද කරන්න බලාපොරොත්තුවෙන්නේ?**

කාලෙක ඉඳලා මගේ අදහසක් තියනවා ශේක්ෂ්පියර්ගේ නාට්‍ය සිංහලට පරිවර්ථනය කරන්න. අවුරුදු තුන හතරකට කලින් මම ජුලියස් සීසර් පරිවර්ථනය කළා. ඒක පොතක් වශයෙනුත් පළකෙරුණා. දැන් මම තවත් දෙක තුනක් එකපාරටම පරිවර්ථනය කරගෙන යනවා. එකක් 'දොළොස්වෙනි රාත්‍රිය'. ඒකත් මම මීට කලින් පරිවර්ථනය කරලා, වේදිකාගත කළ එකක්. මේ සැරේ මම ඒකට දීර්ඝ ප්‍රස්ථාවනාවක් ලියනවා. ශේක්ෂ්පියර්ගේ නාට්‍ය පසුබිම ගැන. පළවෙනි එළිසබෙත් රැජිනගේ කාලය සාහිත්‍ය, නාට්‍ය අතින් බැලුවම ස්වර්ණමය යුගයක් කියලා කියන්න පුළුවන්. ශේක්ෂ්පියර් ඇරුණම ක්‍රිස්ටෝපර් මාලෝ කියන නාට්‍ය රචකයා, බෙන් ජොන්සන් කියන නාට්‍ය රචකයා, ඊට පෙර තෝමස් නෝට්න්. ඔය විදිහේ නොයෙක් නාට්‍ය රචකයන් ඒ කාලේ බිහිවුණා. ඉතිං මට පෞද්ගලිකව දැඩි ආකර්ශණයක් තියන විෂයක් ඒක. එක්තරා විදිහකින් මේ පරිවර්ථනයන් කරන්නේ සිංහල නාට්‍ය කලාව පෝෂණය කරන්න. 'මිම්මට මිම්ම' කියන නාටක පිටපතත් මේ වෙනකොට මම දළ වශයෙන් පරිවර්ථනය කරලා තියනවා. මම හිතුවා දැන් මට ලබන්නේ හැත්තෑපහ. හැත්තෑපහේ ඉඳලා අසූව වෙනකම් අනෙක් වැඩවලට අත දාන්නේ නැතිව කෙලින්ම මේ වැඩේට බහින්න ඕනේ කියලා.

**ඔබ ක්ෂේත්‍රයට පිවිසෙන්නේ වේදිකා නාට්‍ය නළුවෙක් විදිහට. ක්ෂේත්‍රයේ අනන්‍යතාව සටහන් කරන්නේ චිත්‍රපටි නළුවෙක් විදිහට. මේ නළු භූමිකාවෙන් මිදිලා තිර රචනයට යොමුවීම කොහොමද සිද්ධ වුණේ?**

ඒක අහම්බයක්. මම කොහොමටවත් හිතුවේ නෑ පිටපත් රචකයෙක් වෙන්න. ගාමිණී ෆොන්සේකා එක්ද-ාස් නවසිය අසූ පහේදී එයාගේ 'කොටි වලිගය' කියන කතාවේ තිර නාටකය ලියන්න කියලා මට කිව්වා. ඒකෙන් පස්සේ මට චිත්‍රපටි ගණනාවක තිර රචනා ලියන්න ආරාධනා ලැබුණා.

**ඒ කාලයේ හිටිය පළපුරුදු තිර නාටක රචකයන් අතරින් කෙනෙක් තමන්ගේ වැඩේට තෝරාගන්නේ නැතිව සමකාලීන නළුවෙක් වුණ ඔබව ඔහු මේ කටයුත්තට තෝරාගත්තේ ඇයි කියලද හිතෙන්නේ?**

අපි දෙදෙනා අතර තිබුණා ඉතාම සමීප මිත්‍රත්තවයක්. ඉතිං එයා කියන දේ හුගාක් තිර රචකයන්ට වඩා මට පැහැදිලියි. ඒ වගේම ගාමිණී ෆොන්සේකා මහතා හිතන්න ඇති අපේ මිත්‍රත්වය උඩ එයාගේ අදහස් උදහස් මට වැඩියෙන්ම පැහැදිලිවෙයි කියලා. ඒකේ එක්තරා සත්‍යයක් තියනවා. මම අධ්‍යක්ෂවරුන් විශාල පිරිසක් එක්ක වැඩ කරලා තියනවා. ඉතිං මට හිතෙනවා කතාවක් දුන්නම මේක ලෙස්ටර් ජේම්ස් පීරිස් කරනවනම් මේ විදිහට තිර නාටකය ලියවෙයි. ගාමිණී ෆොන්සේකා කළා නම් එයා ඒක බලන්නේ වෙනත් කෝණයකින්. ආචාර්ය ඩී.බී. නිහාල්සිංහ මහත්තයා කෙරුවා නම් එයා තවත් කෝණයකින් බලන්නේ. ඉතිං මට මේ හැම කෙනෙක්ගෙම ඇසුර ලැබිලා තියන නිසා ඒ අයගේ දෘෂ්ඨි කෝණය වටහා ගන්න මට පරිචයක් තියනවා.

**කොටි වලිගයෙන් පටන් අරගෙන ඔබ තිර කතා රචකයකු විදිහට දිගටම ඉදිරියට යන ගමන ගැන මොනවගේ හැඟීමක්ද තියෙන්නේ?**

මම දන්නේ නෑ මම ලියන තිර නාටක ගුණාත්මක පක්ෂයෙන් කොයි තරම් උසස් ද කියලා. දැන් තිස්ස අබේසේකර මහත්තයා කිව්වා කොටිවලිගය කලාත්මක චිත්‍රපටියක් නෙවෙයි කියලා. ගාමිණී ෆොන්සේකා කිව්වා අපි කලාත්මක චිත්‍රපටියක් හැදුවේ නෑ කියලා. මොකද ගාමිණීගේ අදහස වාණිජ, කලාත්මක කියලා චිත්‍රපටි වර්ග කරන්න බෑ කියන එකයි. යම් දෙයක් සිනමාරූපීව ඉදිරිපත් වෙනවා නම් ඒක හොඳ චිත්‍රපටියක් කියලා. මාත් ඒ අනුව සිතන කෙනෙක්.

**මෑත භාගයේ නිෂ්පාදනය කෙරුණු 'අස්වැද්දුම' චිත්‍රපටියේ මුලින්ම ඔබ ලියූ තිර රචනය අධ්‍යක්ෂවරයා ප්‍රතික්ශේප කළ බව කියන්නේ ඇත්තද?**

මම බත්තරමුල්ලේ ඉන්න දවස්වල බෙනට් රත්නායක දවසක් මට කිව්වා ඉතාලි කෙටි කතාවක් තියනවා ටෝනි අයියේ තිර රචනයක් ලියලා දෙන්න පුළුවන් ද කියලා. මම කිව්වා මට සුමානෙකින් ඔයාට දෙන්න පුළුවන් මූලික සටහනක්. අවසන් පිටපත මම මාසෙකින් වගේ දෙන්නම්. මට ලක්ෂ තුනක් විතර දෙන්න කියලා. මම සුමානෙකින් වන් ලයින් ට්‍රීට්මන් එක දුන්නාම ලක්ෂ එකහමාරක් දෙන්න. අවසාන පිටපත දුන්නම ඉතිරි මුදල දෙන්න කියලා. ඉතිං මම කියපු විදිහට සතියකින් එයාට වන්ලයින් ට්‍රීට්මන්ට් එකක් ගහලා දුන්නා. එතකොට මෙන්න එයා මට කියනවා 'මගේ කතාවනේ අයියා, මමම පිටපත ලියාගන්නම් කියලා. මම ඉතිං එයාගෙන් ඇහුවා ඔය ටික ඔයාට පැහැදිලි වෙන්න මෙච්චර කාලයක් ගියාද කියලා. ඊට පස්සේ එයාම ඒකක කරගෙන තිබුණා. ඕක තමයි ඔය ප්‍රතික්ශේප කළා කියනවා ඇත්තේ

**වර්ථමාන සිංහල සිනමාවේ හොඳ චිත්‍රපටි බිහිනො-වෙන්න හේතුවක් සාර්ථක තිර රචනා නැතිකම සහ දක්ෂ තිර රචකයන් නැතිකම කියා මතයක් තියනවා. ඒ මතයත් එක්ක ඔබ එකගද?**

එහෙම මතයක් තියනවා. නමුත් ඕකේ අනෙක් පැත්තත් ගන්න පුළුවන්නේ. හොඳ පිටපතක් තිබුණ පමණින් සාර්ථක චිත්‍රපටියක් නිර්මාණය වෙනවද? නෑ. හොඳ පිටපතක් තිබීම කියන්නේ චිත්‍රපටියක සාර්ථකත්වයට මුල් වෙන එක් කාරණයක් විතරයි. හොඳ තිර පිටපතක් නොතිබුණත්, හොඳ කතාවක් තියනවා නම් ඒ තුලින් දක්ෂ අධ්‍යක්ෂවරයෙකුට පුළුවන් හොඳ චිත්‍රපටියක් හදන්න. හුගාක් තැන්වල කියන දෙයක් තමයි හොඳ තිර රචනා නෑ. තිර නාටක රචකයෝ හිගයි කියන එක. ඒ අධ්‍යක්ෂවරු හිතනවා ඇත්තේ ඒගොල්ලන්ට උවමනා ජාතියේ තිර පිටපතක් ලියලා අපි ට්‍රේකේ තියලා අල්ලන් ඉන්න ඕනේ කියලා වෙන්න ඇති. හරි, ඉතිං දක්ෂ තිර නාටක රචකයෝ නෑ කියලා ගමු. එහෙමනම් ඉතිං ප්‍රසන්න විතානගේට වගේ අනෙක් අධ්‍යක්ෂවරුන්ටත් පුළුවන්නේ තමන්ගේ කතාවට තමන්ම තිර නාටකය ලියාගන්න.

**ඔබ වේදිකාව වෙනුවෙන් ලියන තරම් සිනමාව වෙනුවෙන් යමක් ලියන්න උනන්දුක් දක්වන්නේ නැති බවකුයි පෙනෙන්නේ?**

එක හේතුවක් තමයි තරුණ කාලේ ඉඳලා මගේ දැඩි ආශාවක් තිබුණ කෙනෙක්නේ ශේක්ෂ්පියර්. ඒ නිසා ඔහුගේ නාට්‍ය පිටපත් පරිවර්ථනය කරනවා. අනෙක මගේ හිතේ දැන් සිනමාවට පරිවර්ථනයන් කරලා වැඩක් නෑ. දැන් අපේ අලුත් අය යන ආර අපිට පුරුදු ආරක් නෙවෙයි. මට කෙනෙක් හෙට කිව්වොත් තරුණ ප්‍රේමය ගැන තිර නාටකයක් ලියන්න කියලා මම බැහැයි කියනවා. මොකද දැන් තරුණයෝ, ඒ